# සැමටම පොදු සමෘද්ධියක් කරා
# ඉදිරිමග සැලසුම් කරමු

පාත්ෆයින්ඩර් පදනම
කොළඹ
2015

## අන්තර්ගතය


හැඳින්වීම........................................................................3
1. ශක්තිමත් සාර්ව ආර්ථික මූලධර්ම පවත්වාගෙන යාම.........10
2. ව්‍යාපාර සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීම...........13
3. සාධක වෙළෙඳපොළ වර්ග...............................................16
3.1 සාධක වෙළෙඳපොළ - ඉඩම්.......................................16
3.2 සාධක වෙළෙඳපොළ - ශ්‍රමය.......................................17
3.3 සාධක වෙළෙඳපොළ - මූල්‍ය සහ ප්‍රාග්ධන වෙළඳපොළ.18
4. අපනයන සහ සෘජු විදේශීය ආයෝජන..............................21
5. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය.........................................25
6. කෘෂි ඵලදායිතාව ඉහළ නැංවීම.........................................27
7. අධ්‍යාපනය, පුහුණු කිරීම් සහ නිපුණතා සංවර්ධනය...........29
8. වතුකරයේ ප්‍රජාව බලගැන්වීම............................................31
9. රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණය.........................................33
10. රාජ්‍ය සේවාවන් ලබාදීම කාර්යක්ෂම කිරීම.....................35
11. සමාජ සුරක්ෂිතතාව........................................................37
12. නැගී එන මහා ප්‍රවණතාවන්ගෙන් ප්‍රයෝජන ගැනීම.........39

සමාප්තිය........................................................................42

ආර්ථික සංවර්ධන ක්‍රියාමාර්ගයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව අනුගමනය කළයුතුවන්නේ ලෝකයේ බොහෝ රටවල් විසින් අනුගමනය කරනු ලබන මනා ව්‍යවහාරයන්ය. දේශපාලන පක්ෂවල ප්‍රතිපත්ති ප්‍රකාශන තුලින් ඉදිරිපත් කරනු ලබන දීමනා, සහන සහ සුබසාධක ක්‍රියාමාර්ග සියල්ලම සම්බන්ධයෙන් පිරිවැය ගණනය කිරීමක් කළයුතුය. එමෙන්ම, ඒ සඳහා දරන්නට සිදුවන අතිරේක පිරිවැය උපයාගන්නා ආකාරය ද දැක්විය යුතුවේ. ප්‍රතිපත්ති ප්‍රකාශන හරහා දෙනු ලබන පොරොන්දු ඉටුකිරීමට පවතින මූල්‍ය ශක්‍යතාවය පිළිබඳව තක්සේරුවක් කිරීමට මේ කරුණු ඡන්දදායකයාට ඉඩ සලසනු ඇත. ඒ හැරුණුවිට, චිරාත් කාලයක් පුරා සියළුම පක්ෂ ප්‍රතිපත්ති ප්‍රකාශනයන්හි විශේෂිත අංගයක් වූ " නොපවත්නා සම්පත් වෙන්දේසිකිරීමේ" ලක්ෂණය නැතිකිරීමට ද මෙය උපකාරයක් වනු නියතය.

හැඳින්වීම

ශ්‍රී ලංකාව වෙනුවෙන් විචක්ෂණශීලී ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනයෙහි ලා පාත්ෆයින්ඩර් පදනම දිගු කලක් තිස්සේ දායකත්වය සපයයි. ආර්ථික සංවර්ධනය වේගවත් කිරීමේ ප්‍රතිසංස්කරණයන් සඳහා නිරන්තරව සැපයූ උපදේශනයන් තුළින් එම දායකත්වය සපයන ලදී.

නුදුරේදීම පාර්ලිමේන්තු මැතිවරණයක් පැවැත්වීමට නියමිත හෙයින් අත්‍යාවශ්‍ය වෙනස්කම් ක්‍රියාවට නැංවෙන අවස්ථාවන් සඳහා මඟ පාදන්නා වූ නව දේශපාලන යුගයක දොරටුව අබියසට දැන් ශ්‍රී ලංකාව එළැඹ සිටී.

එබැවින් දේශපාලන පක්ෂයන් හි ප්‍රතිපත්ති ප්‍රකාශනයන් සැකසීමේ ක්‍රියාවලිය වෙත කිසියම් බලපෑමක් කිරීම සඳහා සුදුසුම අවස්ථාව මෙයයි. තිරසාර සංවර්ධන මාවතක් වෙත ශ්‍රී ලාංකේය ආර්ථිකය සාර්ථකව අවතීර්ණ කරවීම පිණිස උපස්ථම්භක වන්නා වූ ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන් පිළිබඳ අධ්‍යයන ගණනාවක් පාත්ෆයින්ඩර් පදනම විසින් සිදුකර ඇත. මහජන සම්මන්ත්‍රණ රැසක් ද ප්‍රමුඛ පෙළේ විද්වතුන් ගේ අදහස් ද වෙනත් රටවල අත්දැකීම් පිළිබඳව කරන ලද සොයාබැලීම් ද එකී අධ්‍යයනයන් හි දී උපයෝගී කරගන්නා ලදී.

පාත්ෆයින්ඩර් පදනමෙහි ප්‍රයත්නය වන්නේ කිසිදු න්‍යායයක් පදනම් කොට ගත් ආදර්ශයන් අනුගමනය කිරිමෙන් වැළකී අතිශයින් ම ප්‍රායෝගික වූත් ක්‍රියාවට නැංවිය හැකි වූත් ප්‍රතිසංස්කරණයන් දේශපාලන පක්ෂයන් හි අවධානය සඳහා යොමු කරවිය හැකි වන සේ මෙම ලේඛනය සැකසීමයි. මෙහි එන අදහස් ඉදිරිපත් කරනු ලබන්නේ සියලූ ම ශ්‍රී ලාංකිකයන්

ගේ ජීවන තත්ත්වයන් නගා සිටුවීමේ අභිලාශය ම පෙරදැරි කොට ගෙන ය.

සියලු ම දේශපාලන පක්ෂ විසින් ප්‍රකාශ කැරෙන, සියල්ලන් වෙත ම උසස් ජීවන තත්ත්වයක් ලබා දීමේ අරමුණ සාක්ෂාත් කරගැනීමට නම් මෙරට ආර්ථිකය තුළ තවත් ප්‍රතිසංස්කරණ රාශියක් සිදු කළ යුතුව තිබේ. ඉහළ-මධ්‍යම ආදායම් ලබන රටක් බවට සහ ඊටත් ඔබ්බෙන් වන තත්වයන්ට ශීඝ්‍රයෙන් පත් වීම සඳහා වූ අපේක්ෂාව ශ්‍රී ලාංකේය සමාජය තුළ පවතී. එබැවින් ශ්‍රී ලාංකේය සමාජයේ සෑම අංශයක් තුළ ම වැඩෙන බලාපොරොත්තු සඳහා නිසි ප්‍රතිචාර දැක්වීමේ වගකීම සෑම දේශපාලන පක්ෂයක් වෙත ම පැවරේ. නව පරිපාලනය කෙතරම් ප්‍රජාතන්ත්‍රවාදී වුව ද ඉහත කී අපේක්ෂාවන් ඉටුකරන්නට අසමත්වුවහොත් එයින් දේශපාලන මෙන්ම සමාජයීය වශයෙන් ද අතිශය හානිකර ප්‍රතිපල අත්කර දෙනු ඇත.

සියලු ම කොටස් ආවරණය කැරෙන්නා වූත් කලාපීය වශයෙන් සමබර වූත් කඩිනම් සංවර්ධනයක් දියත් කිරීම තුළින් සියලු ම ශ්‍රී ලාංකිකයන් ගේ අපේක්ෂාවන් සපුරාලීම පිණිස සෑම දේශපාලන පක්ෂයක ම ප්‍රතිපත්ති සැකසීමේ ක්‍රියාවලිය පෝෂණය කැරෙන තොරතුරු ලබා දීම මෙම සැලසුම් ලේඛනයෙහි අරමුණයි. වෙනසක් සඳහා වූ මෙම සැලසුම් ලේඛනය ඉදිරිපත් කරනු ලබන්නේ පහළ ඵලදායිතා කෘෂි කර්මාන්තය/ නො දියුණු තාක්ෂණය සහිත නිෂ්පාදන සහ සාම්ප්‍රදායික සේවාවන් (සිල්ලර/තොග වෙළෙඳාම, ප්‍රවාහනය සහ සංනිවේදනය, ඉදිකිරීම් හා රාජ්‍ය සේවය) යන අංගයන් ගෙන් සැදුම් ලත් ආර්ථිකයක සිට ඉහළ ඵලදායිතා කෘෂි කර්මාන්තය/දියුණු තාක්ෂණය සහිත නිෂ්පාදන, නාවුක හා ගුවන් සේවා, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT) ව්‍යාපාරික ක්‍රියා බාහිර්යයනය (BPO) දැනුම් ක්‍රියා

බාහිර්යයනය (KPO), මූල්‍ය සේවා සහ අධ්‍යාපන/සෞඛ්‍ය සේවා යන අංගයන් පදනම් කොට ගත් නූතන ආර්ථිකයක් දක්වා සංක්‍රමණය වීමේ අවශ්‍යතාව පිළිබඳ අවබෝධයකින් යුතුව ය.

ආර්ථිකය ස්ථායිකරණය කිරීම සඳහා සහ අත්‍යවශ්‍යවන්නාවූ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණයන් රාශියක් සිදුකිරීම තුලින් ආර්ථිකයේ ඵලදායීතාවය/තරඟකාරිත්වය ඉහළ නැංවීම සඳහා කඩිනම් පියවරගැනීමෙන් තොරව මෙවැනි ආර්ථික පරිණාමයක් අත්කරගැනීම සිදුකළ නොහැකිය.
ශ්‍රී ලංකාවේ මැතිවරණ ″නොපවතින සම්පත් වෙන්දේසි කිරීමකි″ යනුවෙන් ලී ක්වාන් යූ විසින් කරන ලද ප්‍රකාශයට පසුගිය හය මසක පමණ කාලය තුල විශේෂ වැදගත්කමක් ලැබී තිබින. 2014 නොවැම්බරයේදී ඉදිරිපත් කරන ලද අය-වැයෙන් ජනප්‍රියවාදී පියවර රැසක් හඳුන්වා දී තිබූ අතර 2015 ජනවාරි මාසයේදී ඉදිරිපත් කරන ලද අතුරු අය-වැයෙන් එවැනි පියවර තවදුරටත් පුළුල් කර තිබිනි. මේ සියල්ලෙන්ම රටේ මූල්‍ය ස්ථාවරභාවය බරපතල අර්බුදයක් කරා යොමුකර තිබේ. එම වසර සඳහා ඉලක්කගත අය-වැය හිඟය දල දේශීය නිෂ්පාදිතයෙන් සියයට 5.2 ක් වුව ද 2014 වසරේ සැබෑ අය-වැය හිඟය සියයට 6 ක් බව වාර්තා විය. ආදායම් සහ වියදම් යන අංශ දෙක සම්බන්ධයෙන්ම නිසි ක්‍රියාමාර්ග නොගතහොත් රටේ මූල්‍ය තත්වය තවදුරටත් පිරිහෙන්නට බොහෝ ඉඩකඩ තිබේ. තත්වය මෙසේ පවතින හෙයින්, පාර්ළිමේන්තු මැතිවරණය සඳහා සිය ප්‍රතිපත්ති ප්‍රකාශන සැකසීමේදී දේශපාලන පක්ෂ වැඩි මූල්‍ය වගකීමකින් යුතුව කටයුතුකිරීම අතිශයින්ම වැදගත්ය. පසුකාලීනව, අධික උද්ධමනය විසින් සෝදාහැරෙන හෝ බදු පැනවීම හෝ මිල ඉහළනැංවීම සිදුකිරිම තුලින් අනිවාර්යයෙන්ම ආපසු හැරවීමට සිදුවන ‘දීමනා/සහන’ ලබාදීම තුලින් මේ රටේ ජනතාව නොමගයැවීම තවදුරටත් නොකළයුත්තකි.

**2014** අය-වැයෙන් සහ **2015** අතුරු අය-වැයෙන් රාජ්‍ය අයවැයට සිදුකරන ලද හානිය ඉදිරි පාර්ලිමේන්තු මැතිවරණය සඳහා දේශපාලන පක්ෂ විසින් සකස් කරනු ලබන ආත්මාර්ථකාමී සහ ජනතා විරෝධී පොරොන්දු කරණ කොටගෙන තවදුරටත් තීව්‍ර නොවන බවට වගබලා ගතයුතුව තිබේ. එහෙයින්, *ආර්ථික සංවර්ධන ක්‍රියාමාර්ගයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව අනුගමනය කළයුතුවන්නේ ලෝකයේ බොහෝ රටවල් විසින් අනුගමනය කරනු ලබන මනා ව්‍යවහාරයන්ය. දේශපාලන පක්ෂවල ප්‍රතිපත්ති ප්‍රකාශන තුලින් ඉදිරිපත් කරනු ලබන දීමනා, සහන සහ සුබසාධක ක්‍රියාමාර්ග සියල්ලම සම්බන්ධයෙන් පිරිවැය ගණනය කිරීමක් කළයුතුය. එමෙන්ම, ඒ සඳහා දරන්නට සිදුවන අතිරේක පිරිවැය උපයාගන්නා ආකාරය ද දැක්විය යුතුවේ. ප්‍රතිපත්ති ප්‍රකාශන හරහා දෙනු ලබන පොරොන්දු ඉටුකිරීමට පවතින මූල්‍ය ශක්‍යතාවය පිළිබඳව තක්සේරුවක් කිරීමට මේ කරුණු ඡන්දදායකයාට ඉඩ සලසනු ඇත. ඒ හැරුණුවිට, චිරාත් කාලයක් පුරා සියළුම පක්ෂ ප්‍රතිපත්ති ප්‍රකාශනයන්හි විශේෂිත අංගයක් වූ ˝නොපවත්නා සම්පත් වෙන්දේසිකිරීමේ˝ ලක්ෂණය නැතිකිරීමට ද මෙය උපකාරයක් වනු නියතය.*

රටේ දේශපාලන අස්ථාවරත්වය, අතිශය දේශපාලනීකරණය වූ රට තුල ආණ්ඩු පෙරළිය නිසා සිදුවූ කඩාකප්පල්වීම් සහ සාර්ව ආර්ථික දර්ශනයේ පරිහානිය හේතුවෙන් සාර්ව ආර්ථික මූලධර්මයන් විශාල වශයෙන් අනතුරට ලක්වූවා පමණක් නොව ආර්ථික වර්ධනයේ ගම්‍යතාවය බෙහෙවින් දුර්වල වූ බව වටහාගැනීම අතිශයින්ම වැදගත්ය. පසුගිය දශක හතර තුලම වරින් වර සිදුවූ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ නැවතීම

යන චක්‍රය බිඳදැමීමට හැකි අවස්ථාවක් වර්තමාන දේශපාලන වාතාවරණය විසින් නිර්මාණය කර දී තිබේ. ජනතාවගේ ජීවිතවලට සම්බන්ධවන තිරසාර ආර්ථික වර්ධනයක් ඇතිකිරීම උදෙසා ස්ථායිකරණ පියවර ක්‍රියාත්මක කිරීම පමණක් ප්‍රමාණවත් නොවන බව 2012 – 2014 පරිච්ඡේදය දෙස අවධානය යොමුකිරීමෙන් උගත හැකි ප්‍රධානතම පාඩමකි. ආර්ථිකයේ ඵලදායීතාවය/තරඟකාරිත්වය නංවාලීමට සමත් ආර්ථික වර්ධන රාමුවක් නිර්මාණය කිරීම පිණිස සාධක වන ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණයන් මගින් ඉහත කී පියවර අනුපූරණය කිරීම අවශ්‍යය. ජනතාවගේ ආදායම් තත්වයේ තිරසාර වර්ධනය ඇතිකිරීමට හැකිවනු ඇත්තේ මෙම මාර්ගය අනුගමනය කිරීමෙන් පමණකි. ඵලදායිතාවය සමග සංගත නොවූ සහන සහ සහනාධාර කිසිදු අයුරකින් තිරසාරව පවත්වාගෙන යා නොහැක. තිරසාරවූත් රටේ සියලුම ජනතාවට අදාලවන්නාවූත් ආර්ථික වර්ධනයක් සහ සංවර්ධනයක් උදාකරගැනීමට යොදා ගතහැකි ක්‍රම සහ විධි යෝජනා කිරීම මෙම ලියැවිල්ලෙහි අරමුණයි.

ශ්‍රී ලංකාවට ආර්ථික වර්ධන ආකෘතියක් අවශ්‍යව පවතින බව මෙහිදී සම්ප්‍රේෂණය කිරීමට අපේක්ෂා කෙරෙන අරමුණු අතර ප්‍රධාන තැනක් ගනී. මෙම ආකෘතිය, පෞද්ගලික ආයෝජන මත පදනම්වූ එකක් වියයුතුය. රටේ පවතින මූල්‍ය හිඟය සහ රාජ්‍ය ණය ගම්‍යතාවය යන බාධක නිසා 'රාජ්‍ය මූලික' ආර්ථික වර්ධනයක් සහ සංවර්ධනය ක්‍රියාදාමයක් ඇතිවීමේ හැකියාවක් නැත. ආර්ථිකය ඉදිරියට ගෙනයාමේ ධාවන යන්ත්‍රය ලෙස ක්‍රියා කළයුතු වන්නේ දේශීය පෞද්ගලික ආයෝජන සහ සෘජු විදේශීය ආයෝජන යන දෙකොට්ඨාශයයි. රටේ සාර්ව ආර්ථික ස්ථායිතාවයක් ඇතිකිරීමෙන් සහ ව්‍යාපාරික පරිසරය දියුණුකිරීම හරහා සුළු පරිමාණ ගොවියන්ගේ, ක්ෂුද්‍ර කර්මාන්තයන්ගේ සිට විශාල පරිමාණ සමාගම් දක්වා වන පෞද්ගලික ව්‍යවසායකයින්ගේ

නිර්මාණාත්මක ශක්තිය හෙළිකරගැනීමට අවශ්‍ය වාතාවරණය නිර්මාණය කළයුතු වේ.

සාර්ව ආර්ථික ස්ථායිතාවය පවත්වා ගෙනයාම; ව්‍යාපාරික පරිසරය දියුණුකිරීම; සාධක වෙළඳපළ ශක්තිමත් කිරීම; අපයනය සහ ඍජු විදේශීය ආයෝජන ප්‍රවර්ධනය; සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සංවර්ධනය කිරීම. කෘෂිකාර්මික ඵලදායීතාවය නැංවීම; අධ්‍යාපනයේ තත්වය උසස්කිරීම; නිපුණතා සහ පුහුණුව; රාජ්‍ය ව්‍යවසායයන් ප්‍රතිසංස්කරණය; රාජ්‍ය සේවයේ ඵලදායිතාවය ඉහළ නැංවීම; වතු අංශයේ ප්‍රජාවන් බලගැන්වීම; සමාජ ආරක්ෂාව සහ නැගී එමින් පවතින සමහර විශාල නැඹුරුතාවන්ගෙන් ප්‍රයෝජනගැනීම වැනි අංශ සම්බන්ධව ක්‍රියාත්මක වියයුතු ආකාරය මෙම ලේඛනයෙහි සාකච්ඡා කෙරේ.

ඉහත සඳහන් කරන ලද අංශ සම්බන්ධයෙන් අවධානය යොමුකිරීම අවශ්‍ය වන අතරම ඒවායින් බොහොමයක් මධ්‍යම හා දිගු කාලීන අභියෝගයන් බව වටහා ගතයුතුය. ඉදිරියේදී පැවැත්වීමට නියමිත මැතිවරණයෙන් පත්වන ආණ්ඩුව කුමක් වුවත්, රටේ ආර්ථිකය ස්ථායිකරණය කිරීමට සහ හීන වෙමින් යන ආර්ථික වර්ධන වේගය යළි නංවාගැනීමට අවශ්‍යවන සමහර පියවරයන්ට ප්‍රමුඛතාවය ලබාදී ඒවා කඩිනමින් ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කිරීමට එම ආණ්ඩුවට සිදුවනු ඇත. ප්‍රමුඛතාවය ලබාදීම අවශ්‍ය පියවර අතරට රාජ්‍ය ව්‍යවසායයන් ප්‍රතිසංස්කරණය සහ ව්‍යාපාර පරිසරය දියුණුකිරීම අනිවාර්යයෙන්ම ඇතුලත් වියයුතුය.

අකාර්යක්ෂම සහ බොහෝවිට පාඩු ලබන රාජ්‍ය ව්‍යවසායයන් විසින් රටේ සංවර්ධන ශක්‍යතාවය දිගින් දිගටම හීන කරමින් තිබේ. මෙම ගැටළුව සඳහා විවිධාකාරවූ ප්‍රතිපත්තිමය විසඳුම් පවතින අතර පෞද්ගලීකරණය, උපායමාර්ගික ආයෝජන/රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයන් ඇතිකිරීම, ඒවායේ කොටස්වලින් සුළු ප්‍රතිශතයක් කොටස් වෙළඳපලේ අළෙවිකිරීම සහ පෞද්ගලික කළමනාකාරිත්වයන් ලබාගැනීම ඉන් සමහරකි. මෙහි සඳහන් අවසන් විසඳුම හැර අන් සෑම විකල්ප විසඳුමක් තුලින්ම රාජ්‍ය අය-වැයට අත්‍යවශ්‍යව පවතින ආදායම උපදවාගැනීමට හැකියාව ලැබේ (8 වන කොටස බලන්න). රටේ අභ්‍යන්තර ගැටුම් අවසන්වීමෙන් පසුව එළැඹුනු කාල පරිච්ඡේදය තුල වඩාත්ම අසාර්ථක අංශය වූයේ දේශීය සහ විදේශීය පෞද්ගලික ආයෝජන වර්ධනය කරගැනීමයි. එහෙයින්, ව්‍යාපාර කිරීමේ පහසුව වැඩි දියුණුකිරීම උදෙසා අවශ්‍ය වන ස්ථාවර සහ සිදුවෙතැයි අපේක්ෂා කළහැකි ප්‍රතිපත්ති සකස්කිරීමේ සහ ස්ථිර ක්‍රියමාර්ගයන් ගැනීමේ කාර්යයට ඉහළම ප්‍රමුඛතාවය ලබා දිය යුතුය (2 වන කොටස බලන්න).

මෙම පත්‍රිකාව සකස් කිරීම සඳහා පාත්ෆයින්ඩර් පදනම පෙළැඹුණේ කඩිනම් සංවර්ධනයක් සඳහා ශ්‍රී ලංකාවට අවශ්‍ය ජවය ලබා දිය යුතු අවස්ථාව දැන් එළඹ තිබෙන බැවිනි. ඉදිරි මග සැලසුම් කිරීම සඳහා නිසි අරමුණක් හා මනා සම්බන්ධීකරණයක් සහිත ක්‍රියාවලියක් සඳහා යෝග්‍ය අවස්ථාව නිර්මාණය වී තිබෙන්නේ සාමය උදා වීම ද උගත් හා පුහුණුවීමේ හැකියාවන් සහිත ශ්‍රම බලකායක් තිබීම ද වැඩි දියුණු වූ යටිතල පහසුකම් ද නව දේශපාලන පරිසරයක් ආරම්භ වීම ද යන සාධකයන් ඒකරාශිවීම තුළින් ය.

## 1. ශක්තිමත් සාර්ව ආර්ථික මූලධර්ම පවත්වා ගෙනයාම

අස්ථාවර සාර්ව ආර්ථික මූලධර්ම අනුගමනය කිරීම හේතුවෙන් ආර්ථිකය නිදහස් කළ අවස්ථාවේ පටන් ම ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වූයේ අස්ථාවර යන පිළිවෙතකි. තිරසාර නොවන අයවැය පරතරයන් මෙම අස්ථාවරත්වයට ප්‍රධාන හේතුව විය. එබැවින්, මධ්‍යම කාලීන තිරසාර අයවැය රාමුවක් පවත්වාගෙන යාම අවශ්‍යය. එමගින් උද්ධමනය පාලනය කරගැනීම ද ගෙවුම් ශේෂය ස්ථාවරව පවත්වාගෙන යාම ද කළ හැකි වනු ඇත. එසේ ම පොලී අනුපාතයන් පහළ මට්ටමක තබාගනිමින් ව්‍යවහාර මුදල තරගකාරී තත්ත්වයට පත් කරගැනීමට හැකි වීම ද ඉන් අත් වන තවත් හිතකර තත්ත්වයකි. ණය සම්බන්ධ කටයුතු තිරසාර තත්ත්වයෙන් පවත්වාගෙන යාමට යෝග්‍ය වන්නා වූ පරිසරයක් ද ඉන් සැකසේ. සජීවී වර්ධන රටාවක් නිර්මාණය කරලීම සඳහා බලපාන පරිසරය සකස් වීමට ද ශක්තිමත් සාර්ව ආර්ථික මූලධර්ම පූර්ව සාධකයකි.

පහළ-මධ්‍යම ආදායම් උපයන රටක මට්ටම උදා කරගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකාව ක්‍රියාත්මක වන්නේ නව මුහුණුවරකින් යුතුවය. ආර්ථිකයන් ශ්‍රේණිගත කිරීමෙහි නිරත ආයතනයන් හමුවෙහි මෙන් ම ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළෙඳපොළ හමුවෙහි ද ශ්‍රී ලංකාව දැන් ක්‍රමක්‍රමයෙන් ඇස ගැසෙන රටක් බවට පත් වෙමින් තිබේ. සාර්ව ආර්ථික ප්‍රතිපත්ති සැකසීමෙහි ලා මෙම සාධකය ඉදිරියේ දී ද වැදගත් වනු ඇත. මේ සම්බන්ධයෙන් සලකන විට, **2014** නොවැම්බර් අය-වැයෙහි මෙන්ම **2015** අතුරු අයවැයෙහි ද දක්නට ලැබෙන රාජ්‍ය මූල්‍ය වගකීම්වල බාදනය සැලකිල්ල යොමුවිය යුතු කරුණකි. රාජ්‍ය මූල්‍ය ශක්තිය හීනවීම නැවැත්වීමටත් එම ගමන ආපසු හැරවීමටත් ඉහළම

ප්‍රමුඛත්වය ලබාදීම අවශ්‍යය. මෙම ලේඛනයේ හඳුන්වාදීමෙහි සඳහන් කරන ලද පරිද්දෙන්ම දේශපාලන පක්ෂවල ප්‍රතිපත්ති ප්‍රකාශන තුලින් ඉදිරිපත් කරනු ලබන සහන, සහනාධාර සහ සුබසාධක ක්‍රියාමාර්ග සියල්ලම සම්බන්ධයෙන් පිරිවැය ගණනය කිරීමක් කළයුතුය. එමෙන්ම, ඒ සඳහා දරන්නට සිදුවන අතිරේක පිරිවැය උපයාගන්නා ආකාරය ද දැක්විය යුතුවේ. එම තොරතුරු මහජනතාවගේ දැනගැනීම සඳහා ප්‍රසිද්ධ කර සියළුම පංගුකරුවන්ට ඒ සම්බන්ධ විවේචනාත්මකව තක්සේරු කිරීමට අවස්ථාව සැලසිය යුතුය.

යෝජිත ක්‍රියාමාර්ග

- මධ්‍යම කාලීන තිරසාර අයවැය රටාවක් පවත්වාගෙන යාම.
- බදු පදනම පුළුල් කිරීම හා බදු අය කිරීම දියුණු පරිපාලන මට්ටමකට ගෙන ඒම (මේ සම්බන්ධයෙන්, බදු ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ලබාදී ඇති දැනට ක්‍රියාත්මක නොකළ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට අවධානය යොමුකල යුතුය)
- ආදායම් බදු ගෙවන්නන්ට අවම බරක් පැටැවෙන ආකාරයෙන් රාජ්‍ය ආදායම තුළ ඍජු බදුවල තත්ත්වය ඉහළට ගෙන ඒම.
- පුනරාවර්තන වැය සාධාරණීකරණය කිරීම පිණිස මෙන්ම පැහැදිලි සංවර්ධන උපායමාර්ගයක් මත පදනම්වෙමින් සහ සහ ආදායමේ ප්‍රතිශතය මත සිදුකෙරෙන අගැයීම් ක්‍රමයක් අනුගමනය කරමින් රාජ්‍ය ආයෝජන ප්‍රමුඛතාකරණය කිරීම පිණිස රාජ්‍ය වැය බරපතල සමාලෝචනයකට ලක්කිරීම. මෙය සිදු කලයුතු වනුයේ පැහැදිලිව ස්ථාපනය කරන ලද ප්‍රමුඛතා අනුපිළිවෙලකට අනුවය.

**සාර්ව ආර්ථික මූලධර්ම පවත්වාගෙන යාම අනිවාර්ය වන්නා සේ ම තිරසාර 8% ක් ඉක්මවන වර්ධන අනුපාතයක් කරා ළං වීම පිණිස ආර්ථිකයේ නිෂ්පාදන ධාරිතාව පුළුල් කිරීම ද අනිවාර්ය වන්නේ ය. ඉදිරියේ දී පැහැදිලි කිරීමට උත්සාහ දැරෙන්නේ ඒ වෙනුවෙන් කුමක් කළ යුතුව තිබේ ද? යන්න පිළිබඳව ය.**

## 2. ව්‍යාපාර සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීම

නැගෙනහිර සහ අග්නිදිග ආසියාවේ සාර්ථක රටවල සිදු වන ආකාරයෙන් 8% ක් ඉක්මවන වර්ධන අනුපාතයක් ඉදිරි අවුරුදු 10 ත් 20 ත් අතර කාලයක් සඳහා තිරසාර මට්ටමින් පවත්වාගෙන යාම ඇත්තෙන් ම කළ හැකි කාර්යයකි. මේ සඳහා, ව්‍යාපාරික පරිසරය ශක්තිමත් කරලීමෙහි ලා විශේෂයෙන් ම ප්‍රමුඛත්වය ලබා දීම අවශ්‍ය ය. මෙහි හැඳින්වීමෙහි ද සඳහන් කර ඇති පරිදි ශ්‍රී ලංකාවෙහි සංවර්ධන අපේක්ෂාවන් සපුරාගැනීම සඳහා පෞද්ගලික අංශයේ ශක්තිය මෙන් ම ක්‍රියාකාරීත්වය ද අතිශය වැදගත් සාධකයන් වේ. අයවැය පරතරය මෙන් ම රාජ්‍ය ණය මට්ටම ද ශ්‍රී ලංකාව හා සමානව පවතින රටක (අය වැය පරතරය හා ණය මට්ටම ශක්තිමත් තත්ත්වයක පවතින චීනය වැනි රටවල් හැරුණු කොට ) රාජ්‍ය අනුග්‍රහය තුළින් ම පමණක් සංවර්ධන ක්‍රියාවලිය ක්‍රියත්මක කිරීම කළ හැකි වන්නේ නැත. දේශීය මෙන් ම විදේශීය ආයෝජකයන් ගේ විශ්වාසය ඉහළ නංවාගැනීම මෙහි දී මුහුණ දීමට සිදු වන ප්‍රධානතම අභියෝගයයි. සංවිධිත ක්‍රමයක් යටතේ පාලන නීති ලිහිල් කිරීම තුළින් විනිවිද භාවයෙන් යුතු ව්‍යාපාර-හිතකර ප්‍රතිපත්තීන් සැකසීම ද ගනුදෙනු පිරිවැය අඩු කරලීම ද මේ සඳහා අවශ්‍ය ය.

*යෝජිත ක්‍රියාමාර්ග*

- සියළු පංගුකරුවන්ගේ අදහස් ද විමසා දූරදර්ශී වූත් නොවෙනස්ව පවතින්නා වූත් ප්‍රතිපත්ති සකසාගැනීම
- ලෝක බැංකුවේ ව්‍යාපාර කිරීම නම් දර්ශකයේ ශ්‍රී ලංකාවට හිමිව ඇති ස්ථානය ඉහළ නංවාගැනීම

- ගනුදෙනු පිරිවැය පහත හෙළිය හැකි වන සේ නීති රීති හා ක්‍රියාවලීන් විධිමත් කරලීම (එක් ස්ථානයකින් සෑම සේවාවක්ම ලබාගත හැකි මධ්‍යස්ථාන අවශ්‍ය ස්ථානවල ස්ථාපනය කිරීම)
- ගිවිසුම්වල අනුල්ලංඝනීය බව සුරකෙන සවිමත් නීති පද්ධතියක් තුළින් සමථකරණයන් වේගවත් කිරීම
- ක්‍රමානුකූල කරන ලද නීති රෙගුලාසි යොදාගනිමින් සහ පුද්ගලාභිමතය පරිදි ක්‍රියාකිරීමට පවතින අවස්ථා අවම කරමින් අයථා ප්‍රයෝජනයන් ලබාගැනීමට හැකි අවස්ථා අඩුකිරීම
- රාජ්‍ය සහ පෞද්ගලික දෙඅංශයෙහි කාර්භාරයන් පැහැදිලිව වෙන් කොට දැක්වීම. රාජ්‍ය හා පෞද්ගලික අංශ තරඟකාරීව වාණිජමය කටයුතුවල නිරත වන අවස්ථාවන්හිදී දෙ අංශයට ම සමාන අවස්ථාවන් සැලසෙන වාතාවරණයක් ඇති කිරීම.
- ප්‍රධාන පෙළේ යටිතල පහසුකම් හා අනෙකුත් ව්‍යාපෘතීන් තුල රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්වයන් (PPP) සඳහා පවතින අවස්ථාවන් හඳුනාගැනීම.
- ගිවිසුම්වලට එළැඹීමේ කටයුතුවලට හා ප්‍රසම්පාදන ක්‍රියාවලීන් තුලට විනිවිද භාවය හා තරඟකාරිත්වය හඳුන්වාදීම
- නීතියේ ආධිපත්‍යය පවත්වාගෙන යාම සහ වැරදි සිදුකර දඬුවම් ලැබීමෙන් වැලකීසිටීමට ඉඩ නොහැරීම තුලින් ආයෝජකයින් තුල විශ්වාසය තහවුරු කිරීමට සමත්වන සහ තවත් ආර්ථික සහ සමාජයීය අරමුණු රැසක් සාක්ෂාත් කරගැනීමට හැකිවන ශුභදායී වාතාවරණයක් නිර්මාණය කිරීම.
- වාර්ගික හා ආගමික අරගලයන් හේතු කොටගෙන ආර්ථිකය විෂයෙහි ඇති වන්නා වූ

- අවදානම් තත්ත්වයන් අවම වීම පිණිස සාමකාමී සමාජයක් ඇති කිරීම.
- සාම්ප්‍රදායික ආර්ථික හවුල්කරුවන් මෙන් ම නැගී එන ආර්ථික හවුල්කරුවන් ද සමග රාජ්‍ය
- තාන්ත්‍රික සම්බන්ධතාවන් ශක්තිමත් කරගැනීම සහ මෙම සම්බන්ධතාවයන්, විශේෂයෙන්ම, සෘජු විදේශීය ආයෝජන ලබාගැනීම තුලින් ශ්‍රී ලංකාවේ ආර්ථික සමාජයීය අභිමතාර්ථයන් ඉටුකර ගැනීම පිණිස ප්‍රයෝජනයට ගැනීම

# 3. සාධක වෙළෙඳපොළ වර්ග

## 3.1 ඉඩම්

ඉඩම් වෙළෙඳපොළ ශ්‍රී ලාංකිකයනට වාසි දායක වන තත්ත්වයට පත් කරවීම සඳහා ප්‍රමුඛත්වය ලබා දිය යුතු ය. ඉඩමට ප්‍රවේශ වීමේ දුෂ්කරතාවන් මෙකල ව්‍යාපාරික පරිසරය තුළ දක්නට ලැබෙන ප්‍රධාන බාධාවකි. රටේ ඉඩම්වලින් 80% කට ආසන්න ප්‍රමාණයක් රජයේ අයිතිය යටතේ පවතී. එබැවින් ඉඩම් අයිතියත් බදු දීමත් එසේ ම පරිහරණය කිරීමත් සම්බන්ධයෙන් පැහැදිලි හා විනිවිද පෙනෙන ප්‍රතිපත්තියක් පැවතීම අවශ්‍ය ය. වර්තමානයේ දී රටෙහි සමස්ත ශ්‍රම බලකායෙන් 30 % ක් ම යෙදී සිටින්නේ දළ දේශීය නිෂ්පාදිතයෙන් 10% පමණක් සපයන කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රය තුලය. එසේ හෙයින් ග්‍රාමීය ආදායම් ඉහළ නැංවෙන සේ ඵලදායිතාව වර්ධනය කරවීමට නම් ඉඩම් පරිහරණය කැරෙන ආකාරය මෙන් ම නිෂ්පාදන මිශ්‍රිතය ද පිළිබඳව සොයා බැලීම වැදගත්ය. දුම්රිය සහ තැපැල් දෙපාර්තමේන්තු වැනි රජයේ ආයතනයන් සතු, නිසි පරිදි ප්‍රයෝජනයට නො ගැනෙන වටිනා ඉඩම් රටෙහි සෑම තැනෙක ම තිබේ. වඩාත් ඵලදායී ලෙස වාණිජ කටයුතු සඳහා එකී ඉඩම් භාවිතයට ගැනීමෙන් ඒවායෙහි නියම ප්‍රයෝජනය ලබාගැනීම සඳහා පියවර ගැනීම අවශ්‍ය ය. එසේ කිරීම තුළින් රජයේ කාර්යයන් සඳහා ආදායමක් ද ලබාගත හැකිවේ. ජාතික අවශ්‍යතාවන් හා වාණිජමය අවශ්‍යතාවන් සමතුලිත වන ආකාරයෙන් රැකියා හා ආදායම් ඉහළ නැංවීම තුළින් රටෙහි ජනතාව වෙත ප්‍රතිලාභ අත් කර දිය හැකි වන්නා වූ ප්‍රයෝගිකත්වයට මුල් තැන දෙන පරිපූර්ණ වැඩ පිළිවෙළක් සැකසීම මේ සඳහා ප්‍රමුඛත්වයෙහි ලා සැලකිය යුතු අවශ්‍යතාවකි.

යෝජිත ක්‍රියාමාර්ග

- වී වගාවේ ස්වයංපෝෂණය (නිෂ්පාදන අතිරික්තය) සහ ඇතැම් තේ, රබර් හා පොල් ඉඩම්වල ලාභදායීත්වය පහත වැටීම කරුණු සලකා බලමින් ඉඩම් භාවිතය සහ නිෂ්පාදන මිශ්‍රිතය සම්බන්ධයෙන් සමාලෝචනයක් සිදුකිරීම.
- නාගරික ප්‍රදේශවල පිහිටි දුම්රිය සහ තැපැල් දෙපාර්තමේන්තු වැනි රජයේ ආයතනයන් සතු ඉඩම් ඇතුළුව ප්‍රයෝජන නො ගැනෙන ඉඩම්වලින් නිසි ප්‍රයෝජනය ලබාගැනීමට පියවර ගැනීම.
- වඩාත් ඵලදායී වන ආකාරයෙන් ඉඩම් යොදාගැනීමෙහි ලා දැනට බාධා ඇති කරවන
  ඉඩම් නීතිය සමාලෝචනය කිරීම.
- කර්මාන්තමය අවශ්‍යතාවන් සඳහා ඉඩම් මිලට/ බද්දට ගැනීම හා අදාළ පැහැදිලි හා
  විනිවිද භාවයෙන් යුතු ප්‍රතිපත්ති ඇති කරගැනීම. මෙසේ

ඇතිකරන කර්මාන්ත පුරයන්හි

ඉඩම භාවිත වන්නේ කුමන කර්මාන්ත සඳහා ද ඒවායේ විෂය ක්ෂේත්‍රයන් මොනවා ද යන්න පිළිබඳව පැහැදිලිව දැනුමක් ඇතිව කටයුතු කිරීම අවශ්‍ය වේ.

- අයිතිය පැහැදිලි කරන ලද ඉඩම් අඩංගු කර ඉඩම් බැංකුවක් ස්ථාපනය කිරීම. අන්තර්ජාලය ඔස්සේ ඊට ප්‍රවේශ වීමේ හැකියාව තිබිය යුතුය.

## 3.1 ශ්‍රමය

පවතින ශ්‍රම වෙළඳපළෙහි පවතින අනම්‍යශීලී ස්වභාවයන්, ඉහළ වටිනාකමකින් යුත් රැකියා අවස්ථාවන් නිර්මාණය වීමට බාධාවක්ව ඇත. එබැවින්, සේවක අයිතිවාසිකම්,

ආයෝජකයන්ට ලැබෙන ලාභ අනුපාතයන්, රැකියා අවස්ථාවන් නිර්මාණය වීම යන කරුණු අතර මනා සමතුලිතතාවක් සහිත ක්‍රමවේදයක් ඇති කිරීම වැදගත් වේ. දැනට පවතින කම්කරු නීති හේතුවෙන් විධිමත් ව්‍යාපාරයන් ද වැඩි වැඩියෙන් අනියම් සහ තාවකාලික රැකියා ලබාදෙන තත්වයක් ඇතිව තිබේ. මෙයට අමතරව, විශේෂයෙන් ම ශ්‍රම පිරිවැය ද ඇතුළු අනෙකුත් පිරිවැය ඉහළ මට්ටමක පැවතීම හේතු කොටගෙන ස්වකීය අවිධිමත් ව්‍යාපාර විධිමත් ව්‍යවසායයන් බවට පත් කරගැනීමට එකී ව්‍යවසායයන් අධෛර්ය කරවනු ලැබ ඇත. මෙහි ප්‍රතිපලය ලෙස රටේ සමස්ත ශ්‍රම ප්‍රමිතිය වඩා නම්‍යශීලී කම්කරු නීති අනුගමනය කැරෙන තත්ත්වයක් තුළ දී අපේක්ෂා කරන තත්ත්වයට වඩා පහත වැටී තිබේ. එසේ ම ඉහළ ඵලදායිතා/ආදායම් සහිත රැකියා අවස්ථාවන් ද කප්පාදු වී තිබේ.

*යෝජිත ක්‍රියාමාර්ග*

- සේවක සුරක්ෂිතතාව, ආයෝජකයන් ගේ ප්‍රතිලාභ අනුපාත සහ ඉහළ වටිනාකමක් සහිත රැකියා උත්පාදනය යන කරුණු අතර සමතුලිතතාව පවත්වාගෙන යමින් ශ්‍රම වෙළෙඳපොළ තුළ වැඩි නම්‍යශීලී බවක් ඇති කරලීම සඳහා උපයෝගී වන්නා වූ සංස්කරණාත්මක ත්‍රෛපාර්ශ්වික (රජය/සේව්‍යයා/වෘත්තීය සමිති) සහයෝගිතාවකින් යුතු සමාලෝචනයකට දැනට ඇති කම්කරු අණපනත් භාජන කරවීම.

## 3.3 මූල්‍ය සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ

ඵලදායී අවශ්‍යතාවන් වෙනුවෙන් ප්‍රාග්ධන සැපයුමෙහි කාර්යක්ෂමතාව ඉහළ නැංවීම උදෙසා ආර්ථිකයෙහි ජීව රුධිරය වූ මූල්‍ය අංශය හා ප්‍රාග්ධන වෙළෙඳපොළ වර්ධනය කිරීම අතිශය වැදගත්ය. ජාත්‍යන්තර තත්වය සමග සසඳා

බලන කල්හි ශ්‍රී ලංකාවේ බැංකු ක්ෂේත්‍ර යේ මෙහෙයුම් පිරිවැය අධිකය. බැංකු සහ ශාඛා විශාල සංඛ්‍යාවක් පැවතීම හේතුවෙන් බැංකුවල එදිනෙදා කටයුතුවල පිරිවැය අධිකවීම මීට මූලික වශයෙන් හේතු වේ. තැන්පතුවලට ලබාදෙන පොලී අනුපාතයන් සහ ණය ලබාදෙන පොලී අනුපාතයන් අතර වෙනස්කම් ඇතිකිරීමෙහි ලා අධි පිරිවැය හේතුවන අතර ඒ හේතුවෙන් ආර්ථිකය තුල අරමුදල් පිරිවැය ඉහළ නැංවේ. ඒ හැරුණුවිට බැංකු නොවන කුඩා මූල්‍ය ආයතන රාශියක් පැවතීම ද රටේ මූල්‍ය අංශයේ අවදානම සැලකිය යුතු ප්‍රමාණයකින් ඉහළ නැංවීමට හේතුවකි. එක් එක් පෞද්ගලික ආයතනයන්ගේ අවශ්‍යතාවන් සහ මූල්‍ය පද්ධතියේ ස්ථාවරභාවය අතර එකිනෙකට ආවේනික වූ ප්‍රයෝජන තිබුන ද සමීපස්ථ භාවයෙන් ඇතිවන බලපෑම් හේතුවෙන් සමස්ත මූල්‍ය අංශයටම හානි සිදුවිය හැකි හෙයින් මූල්‍ය පද්ධතියේ ස්ථාවර භාවයට ප්‍රමුඛස්ථානය ලබා දිය යුතු වේ. එහෙයින්, මූල්‍ය ක්ෂේත්‍රය වඩා ශක්තිමත් කිරීම අවශ්‍යවීමට විශේෂ හේතු පවතී.

නවීකරණයට භාජන වෙමින් පවතින ආර්ථිකයෙහි අවශ්‍යතාවන් සපුරාලිය හැකි වන පරිදි නව නිෂ්පාදිතයන් ඇති කරමින් ඒ ඒ ආයතනයන් හි ස්ථාවරත්වය පවත්වාගෙන යාම පිණිස දැනට සිදු වෙමින් පවතින මූල්‍ය අංශය ශක්තිමත් කිරීම් හා ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය කිරීම තව දුරටත් තීව්‍ර කළ යුතුව තිබේ. වයස්ගත වෙමින් සිටින පුරවැසියන් ගේ අවශ්‍යතාවන් සපුරාලීමට පියවර ගැනීම ද ඒ සමග ම කළ යුතු කාර්යයකි.

යෝජිත ක්‍රියාමාර්ග

- මූල්‍ය අංශය ශක්තිමත් කිරීම තුලින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් වෙත හා ව්‍යාපාර ආරම්භ කිරීම් හා පුළුල්

කිරීම් ඇතුළු ආර්ථිකයේ විවිධ අංශ වෙත මූල්‍ය පහසුකම් සැපයෙන ප්‍රවේශ මාර්ගයන් වැඩි දියුණු කෙරෙන බවට සහතික කිරීම.

- දිගු කාලීන ණය වෙළෙඳපොළ තව දුරටත් සංවර්ධනය කිරීම.
- තමන්ගේම මුදල් ආයෝජනය කිරීමේ අපේක්ෂාවෙන් පසුවන්නන් සහ බද්ධ ප්‍රාග්ධන සමාගම් දිරිගැන්වීම
- වඩා යහපත් සමාජ තත්ත්වයක් අපේක්ෂා කරමින් නිවාස මිල දී ගැනීමට බලාපොරොත්තු වන පුද්ගලයින්ගේ එම අපේක්ෂාව සාක්ෂාත් කරගැනීමට හැකිවන පරිද්දෙන් උකස් අංශය සංවර්ධනය කිරීම.
- වයස් ගතවන පුරවැසියන්ගේ ගේ අවශ්‍යතාවන් සපුරාගත හැකි වන සේ විශ්‍රාම වැටුප්
- සම්පාදන ව්‍යාපාරය දියුණු කිරීම.

## 4. අපනයන සහ ඍජු විදේශීය ආයෝජන

විශාලත්වයෙන් අඩු වෙළෙඳපොළක් පැවතීම නිසා සංවර්ධන ශක්තිය හීන වන හෙයින් ශ්‍රී ලංකාව වැනි කුඩා රටවල් ඉහළ ම ප්‍රමුඛත්වය ලබා දිය යුතු වන්නේ අපනයන සංවර්ධනය වෙතට ය. අපනයන ක්ෂේත්‍රයේ සීඝ්‍ර පුළුල් කිරීමකින් තොරව මිලියන 21 ක ජනගහණයකට සීමා වූ දේශීය වෙළෙඳපොළට පමණක් සැපයීම් කරමින් සියයට 8% ක තිරසාර ආර්ථික වර්ධනයක් අත්පත් කර ගත නොහේ. දැනට භාණ්ඩ සහ සේවා අපනයන ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙන් 20% ක් පමණි. මැලේසියාව, තායිලන්තය හා වියට්නාමය යන රටවල එම ප්‍රතිශතයන් දැක්වෙන්නේ 70% ත් 75%ත් අතර පවතී. එසේම ආර්ථික වශයෙන් සාර්ථකත්වයක් අත්කරගෙන ඇති නැගෙනහිර සහ අග්නි දිග ආසියාතික රටවල අත්දැකීම අනුව ඍජු විදේශීය ආයෝජන ඉහළ නැංවීම, අපනයන පුළුල් කිරීම් සහ තිරසාර කඩිනම් සංවර්ධනය යන අංග එකිනෙකට සහ දැඩිව බැඳෙන කරුණු බව පැහැදිලි වේ. එබැවින්, දළ දේශීය නිෂ්පාදිතයෙන් 2% ක් සේ දැනට පවතින විදේශීය ඍජු ආයෝජන ප්‍රමාණය අවම වශයෙන් 4% දක්වා හෝ ඉහළ නංවාගැනීම අප ඉදිරියෙහි ඇති ප්‍රධාන අභියෝගයකි.

චීනය සමග ඉදිරි වසර තුළ දී සම්පූර්ණ කිරීමට නියමිත ඇති හා ඉන්දියාව සමග දැනටමත් පවතින වරණීය විධිවිධානයන් ගේ ඒකාබද්ධතාවයෙන් බිලියන 2.5 ජනගහණයකින් යුත් වෙළෙඳපොළක් වෙත ප්‍රවේශ වීමේ අවස්ථාව තුළින් සුවිශාල ප්‍රතිලාභ අත් කරගැනීමේ හැකියාව ශ්‍රී ලංකාවට ලැබෙනු ඇත. ඉහත කී ද්විපාර්ශ්වික නිදහස් වෙළෙඳ ගිවිසුම්, ශ්‍රී ලංකාවේ සහ ඉන්දියාවේ සිදුව ඇති යටිතල පහසුකම් සංවර්ධනයන් මෙන්ම ඍජු විදේශීය ආයෝජනවලට විදේශීය තත්වය ලබාදෙන ශ්‍රී ලංකාවේ වාණිජ කේන්ද්‍ර නීතිරීති විසින් රටේ

ආර්ථික සංවර්ධනය මත පරිවර්තනීය බලපෑමක් සිදුකරනු ඇත.

ඉන්දීය අග්‍රාමාත්‍ය මෝදි ගේ 'ඉන්දියාව තුළ නිපදවමු' පිළිවෙත ද චීනයේ 'සාගර සේද මාවත' වැඩ පිළිවෙළ ද හේතු කොටගෙන විදේශීය සෘජු ආයෝජන සහ අපනයනත් සඳහා කලාපයේ පවතින ඉඩකඩ තවත් පුළුල් වනු ඇත. මේ වන තෙක් මන්දගාමීව පැවති ඉන්දියාවේ භාණ්ඩ නිෂ්පාදන අංශය 'ඉන්දියාව තුළ නිපදවමු' පිළිවෙත තුළින් නව ජවයක් ලැබෙනු ඇති අතර කලාපයේ නව සැපයුම් ජාලයන්ට අවස්ථාවන විවෘත කරනු ඇත. නාවුක කටයුතු ඇතුළු වාණිජ කේන්ද්‍රයකට අදාළ කාර්යයන් සහ ලුහු ඉංජිනේරු වැනි සේවාවන් ඔස්සේ ප්‍රතිලාභ අත්කරගැනීමේ අවස්ථාව, උපායමාර්ගික භූගෝලීය පිහිටීම නිසා 'සාගර සේද මාවත' වැඩ පිළිවෙළ තුලින් ශ්‍රී ලංකාවට ලැබෙනු ඇත .

ඉන්දියාව ආසන්නයේ පිහිටීමත් චීනය සමග සමීප සබඳතා පවත්වාගෙන යාමත් යන කරුණු විදේශීය සෘජු අයෝජනයන් තුලින් පුළුල් වන අපනයන පදනම් කරගත් තිරසාර සංවර්ධනයක් අත්කර ගැනීමට
ශ්‍රී ලංකාවට ප්‍රධාන වශයෙන් උපකාර වනු ඇතැයි ඇතැමෙක් සිතනු ඇත.

ශ්‍රී ලංකාවේ අපනයනයන් ගෙන් 50% ක් ඉක්මවන ප්‍රමාණයක් ලබන්නේ යුරෝපීය හා අමෙරිකානු වෙළඳපළ වෙත බව සිහි තබා ගතයුතු කරුණකි. එබැවින් එකී වෙළෙඳපොළවල් සමග පවත්නා සම්බන්ධතාවන් ශක්තිමත් කරගැනීමට පියවර ගැනීම වැදගත් ය. එසේ ම ශ්‍රී ලංකාවේ බැඳුම්කර සහ කොටස් වෙළෙඳපොළ වෙත ඇදෙන විදේශීය ආයෝජනයන් ගෙන් වැඩි කොටසක් ද පැමිණෙන්නේ අමෙරිකා එක්සත් ජනපදය වෙතින් බව ද සැලකිය යුතුය.

යෝජිත ක්‍රියාමාර්ග

- අපනයනයන් සඳහා අහිතකර තත්ත්වයක් නිර්මාණය වීමට තුඩු නො දෙන තරගකාරී විනිමය අනුපාතයන් සහ වෙළෙඳ ප්‍රතිපත්තීන් (විශේෂයෙන්ම අර්ධ- තීරුබදු සහ අයබදු) සකස්කිරීම.
- අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සිය අපනයන ක්‍රමොපායයන් කඩිනමින් සකසා නිම කරනු ලැබීම. නිෂ්පාදිත විවිධාංගීකරණය හා වෙළෙඳපොළ විවිධාංගීකරණය සඳහා එහි දී ප්‍රමුඛත්වය ලබා දිය යුතු ය.
- සාම්ප්‍රදායික වාණිජ සබඳතාවන් ශක්තිමත් කරගන්නා අතර ම හොඳින් සාකච්ඡා කොට ඉන්දියාව සමග ඇතිකරගන්නා විස්තීරණ ආර්ථික හවුල්කාර ගිවිසුම සහ චීනය සමග ඇති කරගන්නා නිදහස් ආර්ථික ගිවිසුම වැනි කලාපීය සහ ද්විපාර්ශ්වික වෙළඳ ගිවිසුම් ඔස්සේ වෙළෙඳපොළවලට ප්‍රවේශ වීමේ ඉඩකඩ පුළුල් කරගැනීම.
- චීනය සහ ඉන්දියාව සමග පවතින නිදහස් වෙළඳ ගිවිසුම්වලින් වැඩි ප්‍රයෝජන අත්කර ගැනීමට විශේෂත්වයක් දෙමින් ජාත්‍යන්තර වෙළඳාම සඳහා පහසුකම් සැලසීමට (රේගු නිෂ්කාශන ස්වංයක්‍රියකරණය, අන්‍යොන්‍ය පිළිගැනීම් ගිවිසුම් ඔස්සේ ප්‍රමිතීන් පිළිබඳ එකඟතාවක් ඇතිකරගැනීම, රේගු නිෂ්කාශනයන් අප්‍රමාදව කළහැකි ක්‍රම හඳුන්වාදීම වැනි) ප්‍රමුඛතාවයක් ලබාදීම.
- රටේ සංවර්ධන උපායමාර්ගයන්ට අනුකූල වන පරිදි අපනයන ප්‍රවර්ධන කටයුතු සිදුකිරීම සහ ආයෝජන මණ්ඩලයේ කාර්යසාධනය ඉහළ නැංවීම.

- දේශීය හා විදේශීය ගමනාගමනය වැඩිදියුණු වීමට සාධක වන යටිතල පහසුකම් සංවර්ධනය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.
- විදේශයන් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලවලට සම්බන්ධ වාණිජ අංශයන් ශක්තිමත් කිරීම තුළින් ආර්ථික රාජයෝජ්‍යපාය ශක්තිය වැඩි කිරීම.
- චීනයෙහි සහ ඉන්දියාවෙහි ප්‍රධාන වාණිජ නගරවල ආයෝජන හා වෙළෙඳ ප්‍රවර්ධන කාර්යාල පිහිටුවීම සඳහා සමාගම් සහ ව්‍යාපාරික සංගම් දිරිගැන්වෙන පියවර ගැනීම.
- වෙනත් රටවල් විසින් සිදුකර ඇති ආකාරයෙන්ම වෙළෙඳ හා ආයෝජන පහසුකම් සැපයීමේ මධ්‍යස්ථානයන් කොළඹ පිහිටුවීමට පියවර ගන්නා මෙන් චීනය හා ඉන්දියාව වෙතින් ඉල්ලා සිටීම.

## 5. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය

නවීකරණය වෙමින් පවත්නා ආර්ථිකයක් තුළ ප්‍රධාන රැකියා උත්පාදන මාර්ගය වන්නේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් ය. එම ව්‍යවසායයන් සතු තරඟකාරීත්වය හා වෙළෙඳපොළ ප්‍රවේශ අවස්ථාවන් වැඩි දියුණු කරගැනීම සඳහා සමස්ත ව්‍යාපාරික වාතාවරණයෙහි සහයෝගය ලැබිය යුතුය. නො දියුණු තාක්ෂණයන් භාවිත කිරීම ද අඩු ඵලදායීතාව ද නිෂ්පාදිතයන් ප්‍රමිතියෙන් අඩුවීම ද මූල්‍ය පහසුකම් ලබාගැනීමේ අපහසුව හා නිසි මූල්‍ය කළමනාකරණයකින් තොර වීම ද පුහුණු ශ්‍රමය හිඟ වීම ද, නව වෙළඳපල සොයාගැනීමේ නොහැකියාව ද මෙම ගණයේ ව්‍යවසායයන් මුහුණ දෙන ප්‍රධාන අභියෝගයන් වේ. ආයතනික අවහිරයන්, දීර්ඝ හා හිරිහැරකාරී නිලධාරීවාදී ක්‍රමවේදයන් ද, සහයෝගයන් ලබාගැනීම සඳහා විවිධ ආයතන කරා යාමට සිදුවීම ද, පවතින රෙගුලාසිවල දැඩි බව ද සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් පුළුල්වීමට බාධා පමුණුවයි.

යෝජිත ක්‍රියාමාර්ග

- සම්බන්ධීකරණයකින් යුත් පලදායී සහාය සේවාවන් සැපයීමට හැකිවන පරිද්දෙන් දැනට වෙන් වෙන් වශයෙන් පවතින සහාය සේවා ව්‍යුහය ක්‍රමවත් කිරීම
- නව ව්‍යපාර, නවෝත්පාදන හා ව්‍යාපාර පුළුල් කිරීම් දිරි ගැන්වීමට උපකාර වන පරිසර පද්ධතියක් නිර්මාණය කිරීම සඳහා පුහුණුව, යෙදවුම් (තාක්ෂණය ද ඇතුළුව), මූල්‍යයනය සහ අලෙවිකරණය යන අංශයන්ට පැහැදිලි, සංවිධිත සම්බන්ධීකරණයකින් යුතුව මැදිහත්වීම.
- දේශීය සහ/හෝ ජාත්‍යන්තර සැපයුම් දාමයන් සමග සම්බන්ධතාවන් ඇති කරගැනීම/ශක්තිමත් කරවීම තුළින්

වෙළෙඳපොළ ප්‍රවේශ මාර්ග වැඩි කරගැනීම. මේ හරහා නව තාක්ෂණය ලබාගැනීමේ හැකියාව, දැනුම සහ විශාල ව්‍යවසායයන් සමග සබඳතා ඇතිවීමෙන් ආයෝජන ලබාගැනීමට හැකිවීම වැනි ප්‍රතිලාභ ද ඇති වේ.

- ප්‍රාදේශීය වෙළෙඳ මණ්ඩලවල ධාරිතාවය නැංවීම සහ ඒවා බලගැන්වීම

## 6. කෘෂි ඵලදායිතාව ඉහළ නැංවීම

ශ්‍රී ලංකාවේ කෘෂි කර්මාන්තය සම්බන්ධයෙන් දක්නට ලැබෙන මූලික ගැටලුව නම් පුද්ගලයින් බොහෝ දෙනෙකු විසින් නිෂ්පාදනය කුඩා ප්‍රමාණයක් ඇතිකිරීමයි. සහනාධාර, නොමිලේ ජලය ලබාදීම, සහතික මිල, බදු සහනයන් ආදී දැවැන්ත සහයෝගයන් ලැබෙන තත්වයක් තුල වුව ද ඵලදායිතාව සහ ආදායම පහළ මට්ටමක පැවතීමට එම කරුණ හේතුවී තිබේ. එසේ වුව ද සහනාධාර විසින් ලබාදෙන ආරක්ෂාව හේතුවෙන් ජනගහනයෙන් විශාල කොටසක් කෘෂි කර්මාන්තයේ ම නියැලී සිටිති. ප්‍රතිඵලයක් ලෙස, ආර්ථිකයේ මූල්‍ය සහ මානව සම්පත්, අඩු ඵලදායිතාවයකින් යුත් අංශයක් වෙත වැඩියෙන් වෙන්කිරීමේ වරද සිදුවේ. එමගින් පවතින දුලබ සම්පත් ආර්ථිකයේ ප්‍රබල නව අංශ වෙතින් දුබල කෘෂිකර්මාන්තය වෙත හරවා යැවේ. ඉහළ බදු සහ වැඩි ආහාර මිල හරහා කෘෂිකර්මාන්තයට ලබාදෙන අධි සහනාධාරවල බර සමස්ත ජනගහනයටම දරන්නට සිදු වී ඇත.

යෝජිත ක්‍රියාමාර්ග

- ඉඩම් ඒකාබද්ධ කිරීම දිරිගන්වන සහ කැබෙලි කිරීමේ ගැටළුවට විසඳුම් ලැබෙන ආකාරයේ නෛතික සංශෝධනයන් සහ ප්‍රතිපත්තීන් ද හඳුන්වා දීම.
- අකාර්යක්ෂම සහන ක්‍රියාමාර්ගයන් ක්‍රමයෙන් ඉවත් කරමින් වාණිජමය ශක්‍යතාව සහිත කෘෂිකර්මාන්තය දිරිගැන්වීම හරහා ග්‍රාමීය දරිද්‍රතා ගැටළුවට විසඳුම් ලබාදෙන වැඩි පලදායිතාවයකින් යුතු ආර්ථික කාර්යයන් සඳහා මූල්‍ය හා මානව සම්පත් නිදහස් කිරීම.

- කලක් තිස්සේ පවතින වකුගඩු රෝග ගැටළුවට විසඳුමක් වශයෙන්  කෘෂි නිෂ්පාදන සඳහා සෞඛ්‍ය හා පරිසර ප්‍රමිතීන් හඳුන්වා දීම.
- දියුණු ප්‍රවාහන සහ ගබඩා ක්‍රම දිරි ගැන්වීම තුළින් අස්වනු නෙලීමෙන් පසුව සිදු
- වන අපතේ යාම් අවම කරලීම.
- බීජ විශේෂයන් සහ කෘෂිකාර්මික ව්‍යවහාරයන් දියුණුකිරීම පිණිස ව්‍යාප්ති සේවාවන් සහ පර්යේෂණ ධාරිතාවන් ශක්තිමත් කිරීම.   කාලගුණ විපර්යාසයන් හේතුවෙන් නිතර ඇතිවන අහිතකර තත්වයන් (ජලගැලීම් හා නියඟ) මතු වන අනුවර්තනය වීමේ අවශ්‍යතාව පිළිබඳව සලකා බැලීමේ දී මෙහි වැදගත්කම වඩාත් හැඟේ.

## 7. අධ්‍යාපනය, පුහුණු කිරීම් සහ නිපුණතා සංවර්ධනය

පහළ වැටුප් තල මත වැඩි වැඩියෙන් ශ්‍රමය සැපයීම පදනම් කරගත් වර්ධන උපායමාර්ගයක් යැපීමට ශ්‍රී ලංකාවට තවදුරටත් හැකියාවක් නැත. රටේ ජනගහනය ක්‍රමයෙන් වයස් ගතවන තත්වයක් යටතේ (වැඩ කරන වයසේ පසුවන ජනගහනය අඩුවීම) සංවර්ධනයේ ඊළඟ අදියර තුළ ඉදිරියට යා යුතු වන්නේ වඩා පුහුණු ශ්‍රමය මෙන් ම දියුණු තාක්ෂණයන් ද උපයෝගී කරගනිමිනි. මානව සම්පත් හිඟය රටේ සංවර්ධන අපේක්ෂාවන්ට මතු වන බාධාවක් බවට පත් වීමට බොහෝ ඉඩකඩ තිබේ.

ගැහැණු දරුවන් ද ඇතුළුව ඉතා ඉහළ සහභාගිත්ව අනුපාතයන් සාක්ෂාත් කරගැනීම අතින් පවතින අධ්‍යාපන ක්‍රමය සාර්ථකවී ඇත. එසේ වුව ද අධ්‍යාපන ක්‍රමය, වේගයෙන් නවීකරණය වන ආර්ථිකයේ අවශ්‍යතාවනට අනුකූල වන පරිදි සකස් වී නැත. අධ්‍යාපනය, පුහුණු කරවීම් සහ නිපුණතා සංවර්ධනයන් රටේ සංවර්ධන උපායමාර්ගයන් සමග මැනවින් ගැලපීම අවශ්‍ය වේ.

යෝජිත ක්‍රියාමාර්ග

- විභාග කේන්ද්‍රගත කට පාඩම් කිරීමෙන් බැහැර කොට ගෙන සමස්ත අධ්‍යාපන ක්‍රමයම නිර්මාණශීලිත්වය, නිර්මාණශීලී චින්තනය සහ නවෝත්පාදන දිරි ගන්වන්නා වූ දිශාවකට යොමු කරවීම.
- ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි යන විෂයයන් ඉගැන්වීම වඩා ශක්තිමත් කිරීම.

- රටේ සංවර්ධන උපායමාර්ගයන් ගේ ප්‍රමුඛ අංශයන්ට අනුකූලව පුහුණු කරවීම් හා නිපුණතා සංවර්ධන ක්‍රමවේදයන් සැකසීම.
- රාජ්‍ය, පෞද්ගලික, රාජ්‍ය පෞද්ගලික මිශ්‍ර වශයෙන් වන මතවාදයන්ගෙන් තොරව සහ ප්‍රායෝගිකත්වය මත තෘතීය අධ්‍යාපනය වෙනුවෙන් කෙරෙන ආයෝජන ඉහළ නැංවීම.
- පෞද්ගලික තෘතීය අධ්‍යාපනයේ ප්‍රමිති සහතික කිරීම පිණිස අවශ්‍ය නියාමන කටයුතු ශක්තිමත් කිරීම.
- අධ්‍යාපන හා නිපුණතා සංවර්ධන කටයුතුවල නියුතුව සිටින විශාල සංඛ්‍යාවක් වන ආයතන සහ පරිපාටීන් ප්‍රතිව්‍යුහගත කිරීම සහ උසස් මට්ටමකට ගෙන ඒම. (නැගෙනහිර ආසියාව සහ ජර්මනිය වෙතින් ආදර්ශ ලබාගත හැකි ය).
- ජාත්‍යන්තර වශයෙන් තරගකාරී විය හැකි වන සේ රාජ්‍ය විශ්ව විද්‍යාල ප්‍රතිසංවිධානය කිරීම.

# 8. වතුකරයේ ප්‍රජාව බලගැන්වීම

ඉන්දීය ද්‍රවිඩ සම්භවයක් සහිත ජනතාව බහුතරයකින් සැදුම් ලත් වතුකරයේ ජනතාව නිබඳවම කොන්කිරීමට සහ පීඩාවට ලක්ව සිටිති. වසර ගණනාවක් තිස්සේ ඔවුන් ජීවත් වූයේ ආර්ථික, සමාජයීය සහ දේශපාලන වශයෙන් හුදෙකලා වූ කණ්ඩායමක් ලෙසිනි. එබැවින්, ඔවුන් කෙරෙහි විශේෂ අවධානයක් යොමුකිරීම අත්‍යවශ්‍යයෙන්ම කළයුත්තකි. ජීවන තත්වය; පෝෂණය; නිවාස; වත්කම් සහ ඉඩම් හිමිකාරිත්වය; සෞඛ්‍ය තත්වය; අධ්‍යාපන ජයග්‍රහණ (විශේෂයෙන් තෘතීයික මට්ටමේ); රාජ්‍ය සේවයට ඇතුලත්වීම සහ කාන්තාවන්ගේ බලගැන්වීම වැනි සමාජ සහ ආර්ථික දර්ශක රැසකින් මෙම ජනතාව පසුවන්නේ රටේ අනෙකුත් ප්‍රජාවන්ට වඩා පහළිනි. විශේෂයෙන්ම, ප්‍රාදේශීය ලේකම් මට්ටමින් රාජ්‍ය සේවය ඔවුන් වෙත ළඟාවීමට අසමත් වී තිබේ. භූගෝලීය වශයෙන්, වපසරිය වශයෙන් සහ කළමනාකරණය වශයෙන් විවිධ වතු අතර පවතින වෙනස්කම් සැලකිල්ලට යොමුවිය යුතු තවත් බරපතල කරුණෙකි. ප්‍රධාන ජන කොට්ඨාශය සමග සමව ජීවත්වීම මේ ප්‍රජාවගේ අපේක්ෂාවයි. සමහර සංවර්ධන දර්ශකයන් අතින් මොවුන් සහ අනෙකුත් ජනතාව අතර පවතින වෙනස අවම කිරීම උදෙසා නියත පියවර ගැනීමට ප්‍රමුඛතාවයක් ලබාදීම අත්‍යවශ්‍යය.

යෝජිත ක්‍රියාමාර්ග

- විශේෂයෙන්ම ගැබිණි මව්වරුන් සහ දරුවන් ඉලක්ක කරගත් පෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හරහා මේ ජන කොට්ඨාශයේ කුපෝෂණය අනෙක් ප්‍රජාවන්ගේ මට්ටම දක්වා පහළ හෙළීම.

- උසස් තත්වයේ සෞඛ්‍ය සේවාවක් ලබාදීම උදෙසා වතුකරයේ සෞඛ්‍ය සේවා ජාතික සෞඛ්‍ය සේවා පද්ධතිය සමග ඒකාබද්ධ කිරීම.
- නීත්‍යානුකූල අයිතිය හා අවශ්‍ය පහසුකම් සහිත නිවාස ලබාදීම සහතික කෙරෙන වැඩසටහනක් වතු සමාගම්වල මෙන්ම දේශීය විදේශීය දානපතියන් සමග ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීම.
- ගණිත සහ විද්‍යා ධාරාවන්ගෙන් උසස්පෙළට සුදුසුකම් ලබන ශිෂ්‍ය සංඛ්‍යාව වැඩිකිරීමට කටයුතු කිරීම තුලින් එම ධාරාවන්ගෙන් විශ්ව විද්‍යාලයට ඇතුලත්වීමේ අවස්ථා ඉහළ නැංවීම.
- විශේෂයෙන්ම ඉහළ තනතුරු සඳහා මෙම ප්‍රජාවෙන් රජයේ සේවයට ඇතුළුවන සංඛ්‍යාව ඉහළ නැංවීම පිණිස පරිපාටියක් සකස්කිරීම.
- මහජන නියෝජන ආයතන තුලට කාන්තාවන්ට තේරී පත්වීමට ඉඩ සැලසීම තුලින් ඔවුන් බලගැන්වීම.
- ප්‍රජා මට්ටමින් රාජ්‍ය සේවය ලැබීමේ අවස්ථා වැඩි දියුණු කිරීම.
- දකුණු සහ සබරගමුව පළාත්වල වෙසෙන මේ ජනකොටස්වලට විශේෂිත ගැටළු විසඳීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- මේ ජන කොට්ඨාශය සහ ආර්ථිකයේ අනෙකුත් ජන කොට්ඨාශ අතර පවතින සමාජ ආර්ථික දර්ශකයන්ගේ වෙනස්කම් අවම කිරීම පිණිස, අධ්‍යාපනය, කුපෝෂණය, සෞඛ්‍ය සහ නිවාස සැපයීම වැනි අංශවලට විශේෂ අවධාරණයක් සහිත මධ්‍ය කාලීන වැඩසටහනක් බහු දානපති (රාජ්‍ය, සමාගම්, බහුජාතික සහ රාජ්‍ය නොවන සංවිධාන) සහභාගිත්වය සහිතව ක්‍රියාත්මක කිරීම උදෙසා සකස්කිරිම.

ව්‍යව□□□□□□□□□ හිමිකම් ව්‍යුහය නම්‍යශීලී කිරීම (සේවක කොටස් අයිතිය සහ රාජ්‍ය පෞද්ගලික හවුල්කාර ගිවිසුම් වැනි).

- බහුතර අයිතිය පෞද්ගලික අංශයට පැවරීම සුදුසු නොවේ යැයි හැඟෙන අවස්ථාවලදී වාණිජ කටයුතුවල යෙදෙන රාජ්‍ය ව්‍යවසායයන්ගේ කොටස්වලින් සුළුතරයක් කොටස් වෙළඳපළට ඇතුලත් කිරීමෙන් එම ආයතනය බාහිරට අනාවරණය වීම ඉහල යාම තුලින් පරිපාලනය ශක්තිමත් වීම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිවීම සිදුවේ.
- වෙළෙඳපොළ සංඥාවන් වෙත හොඳින් ප්‍රතිචාර දැක්වීම පිණිස මෙහෙයුම් කටයුතු වඩා ස්වාධීන කිරීම තුලින් පහත දැක්වෙන අවශ්‍යතාවයන් අඩු කරගැනීම.

(I ) දුෂ්කර මූල්‍ය තත්ත්වයන් යටතේ රජය විසින් ලබාදෙන ආධාර සහ (II) ගුණාත්මක බවින් අඩු භාණ්ඩ වැඩි මිලකට ලබාගත යුතු වන තත්ත්වයක් පරිභෝජකයා හමුවෙහි නිර්මාණය කරමින් තරඟකාරිත්වය සීමිත කෙරෙන ආරක්ෂිත පියවර

- රාජ්‍ය ව්‍යවසායයන්ගේ කාර්ය සාධන අපේක්ෂාව ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව සකස්කිරීම
- කෝප් වාර්තාවන් හි සඳහන් කර ඇති නිර්දේශයන් නො පමාව ක්‍රියාත්මක කිරීම.

## 10. රාජ්‍ය සේවාවන් ලබාදීම කාර්යක්ෂම කිරීම

ප්‍රතිපත්ති සැකසීම සහ සේවා සැපයුම සම්බන්ධයෙන් රාජ්‍ය සේවය දක්වන කාර්යක්ෂමතාව ආර්ථිකයෙහි තරඟකාරිත්වය ඇතිකරගැනීම සඳහා වූ අනිවාර්ය සාධකයකි. නවීන ආර්ථිකයක දී නිදහස් වෙළෙඳපළ තුළ වූ තරඟකාරී අවශ්‍යතාවන් තුලනය කිරීම පිණිස නවීන නීතිරීතිවලට වැදගත් තැනක් ලැබේ. එසේ ම, සේවාසැපයීමේ කාර්යක්ෂමතාව ආර්ථිකය තරඟකාරීත්වය අත්කර ගැනීමට උපකාර වනවා පමණක් නොව දිළිඳු සහ අවදානමට පත්වීමේ ශක්‍යතාවයෙන් වැඩි සමාජ කොටස්වල අවශ්‍යතාවන් සපුරාලීමට ද එකසේ වැදගත්ය. ඒක පුද්ගල පදනම අනුව බලන විට ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවය ලොව අනෙකුත් රටවලට සාපේක්ෂව අතිශයින් විශාලය. 2005 වර්ෂයේදී ලක්ෂ 6 ක් ව පැවති රාජ්‍ය සේවක සංඛ්‍යාව මේ වනවිට මිලියන 1.4 දක්ව ඉහළ නැංවී තිබේ. රාජ්‍ය සේවය විසින් විශාල මානව සහ මූල්‍ය සම්පත් ප්‍රමාණයක් අවශෝෂණය කරගන්නා නමුදු එයින් ලැබෙන ඵලය ඉතා අඩුය. එබැවින් රාජ්‍ය සේවයේ සංඛ්‍යාව අඩුකිරීමට සහ ඵලදායිතාව, උද්‍යොගය හා වගකීම ඉහළ මට්ටමකට ගෙන ඒම ප්‍රමුඛ අවශ්‍යතාවකි. දැන්, සහන කොන්දේසි යටතේ මූල්‍යාධාර ලැබීමට අයිතිවාසිකම් නොමැති පහළ-මධ්‍යයම ආදායම් ලබන රටක් බවට පත්ව සිටින ශ්‍රී ලංකාවට රාජ්‍ය සේවය රැකියා ලබාදෙන ආයතනයක් ලෙස භාවිත කිරීමේ හැකියාවක් නොමැත. ආර්ථිකයේ තරඟකාරිත්වය වැඩි කිරීමටත්, මනා අධ්‍යාපන, පුහුණු සහ නිපුණතා සංවර්ධනය තුලින් තරුණ පරපුර බලගැන්වීමෙන් ඉහළ මට්ටමේ රැකියාවන්

සහිත නවීන ආර්ථිකයක් ප්‍රවර්ධනය කිරීමටත් පවතින අවශ්‍යතාවය ඉහත දක්වන ලද හේතුව නිසා තව තවත් වැදගත් කමින් ඉහළ යයි.

යෝජිත ක්‍රියාමාර්ග

- අනෙකුත් රටවල අත්දැකීම් පාඩම් ලෙස ගනිමින් ස්වභාවික කරුණු සහ ස්ව කැමැත්තෙන් සේවය හැරයාමේ වැඩසටහන් හරහා රාජ්‍ය සේවයේ සංඛ්‍යාව අඩුකිරීම. විකල්ප රැකියා නිර්මාණය කිරීමට හැකිවන පරිසරයක් ඇතිකරීම සාධක වන ප්‍රතිපත්ති සකස්කිරීම සමග මෙය සමගාමී කිරීම පිණිස විශේෂ සැලකිල්ලක් දැක්විය යුතුය.
- ස්වාධීන තීරණ ගැනීමට රාජ්‍ය සේවකයන් සතු බලය සහ ඔවුන්ගේ වගකීම් ඉහළ දැමීම.
- පත්වීම් ලබාදීම ස්වාධීන සහ අවශ්‍යතාව පදනම්ව සිදුකිරීම.
- පත්වීම් හා උසස් කිරීම් ආදී කටයුතු සඳහා ස්වාධීන වූ ආයතනික පටිපාටීන් අනුගමනය කිරීම.
- රැකියාවන් ආරම්භ කිරීමේ දී සහ සේවයේ යෙදී සිටින අතරතුර සිදුකරන පුහුණු වැඩසටහන් වැඩි දියුණු කිරීම.
- කාර්යසාධන අගැයීම් ක්‍රමය දියුණු කිරීම සහ කාර්යසාධනයට අනුව ගෙවීම් කිරීමට ඇති හැකියාව ගැඹුරින් සොයා බැලීම.
- සේවා සැපයීම දියුණුකිරීම සඳහා විද්‍යුත් දත්ත සමුදායක් සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණමය ක්‍රම භාවිතයට ගැනීම.

## 11. සමාජ සුරක්ෂිතතාව

මැනවින් සැලසුම් කරන ලද, ඉලක්ක සහිත සහ කාර්යක්ෂමව ක්‍රියාත්මක වන සමාජ සුරක්ෂිතතා වැඩ පිළිවෙළක වැදගත්කම, වැඩි තරඟකාරීත්වයකින් යුතු ආර්ථිකයක් වෙත සිදුකෙරෙන ගමනකදී වැඩි වැඩියෙන් දැනේ. ශ්‍රී ලංකා ආර්ථිකයේ පරිණාමයක් සිදුවෙමින් පවතින අවස්ථාවක දී නිසැකව ම නිර්මාණය වන සංක්‍රාන්තික (නවීනත්වය වෙත මාරු වීමේ) පිරිවැයට මුහුණ දීමට නිසි සමාජ සුරක්ෂිතතා වැඩ පිළිවෙළක් අවශ්‍යය. එවන් වැඩ පිළිවලක් තුලින් ආරක්ෂා කරනු ලබන්නේ සේවකයින් විනා ඵලදායිතාවෙන් තොර රැකියාවන් නොවේ. දිළිඳු සහ අවදානමට ලක්විය හැකි තත්වයක සිටින සමාජ කොටස්වලට සහාය ලබාදීම සමාජ සුරක්ෂිතතා වැඩ පිළිවෙළකින් ඉටුවන තවත් මෙහෙයකි. මෙකී අරමුණු දෙක ම පෙරදැරි කරගත් සමාජ සුරක්ෂිතතා ක්‍රියාවලියක් පදනම් වියයුත්තේ මැනවින් සැලසුම් කරන ලද ආදායම් පැවරීමේ වැඩසටහනක් මත විනා අකාරයක්ෂම සම්පත් භාවිතයකට මග පාදන සහන හෝ සහතික මිල ලබාදීම මත නොවේ. එමෙන්ම ඉහළ බදු සහ භාණ්ඩ මිල තුළින් ජනතාව වෙත බර පැටවීමකට මග නොපාදන බවට මෙවන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී වගබලා ගතයුතුය.
දුර්වල සැලසුම් සහ ඉලක්කයන් සහිත සමාජ සුරක්ෂිතතා වැඩසටහන් දිගු කාලයක් තිස්සේ ශ්‍රී ලංකාව පුරුදුවී සිටී. දැනට ද ක්‍රියාත්මක වන එවැනි වැඩසටහන් ද මෙම ගණයටම අයත්වන බව සඳහන් කළයුතුය.

යෝජිත ක්‍රියාමාර්ග

- ඉතා සැලකිල්ලෙන් යුතුව නිගමනය කරන ලද දරිද්‍රතා මට්ටමකින් පහළ ජීවත් වන ජන කොටස් වෙත ආදායම් ලබා දීම සඳහා වූ සැලසුමක් සැකසීම.
- ආර්ථික සංක්‍රමණයෙහි ප්‍රතිපලයක් වශයෙන් රැකියා අහිමි වන්නවුන් වෙනුවෙන් කාල
  රාමුවකට යටත්ව ආධාර ලබාදීමේ වැඩ පිළිවෙළක් දියත් කිරීම. නැවත පුහුණු කරවීමේ වැඩ පිළිවෙළක් ද ඊට සමගාමීව ක්‍රියාත්මක කළ යුතු ය.

- සමාජ සුරක්ෂිතතා වැඩ සටහන්වල සේවය ලබා දීම ශක්තිමත් කිරීම සඳහා දියුණු
  තාක්ෂණ මෙවලම් භාවිත කිරීම.

## 12. නැගී එන මහා ප්‍රවණතාවන්ගෙන් ප්‍රයෝජන ගැනීම

ඉදිරි දැක්මකින් යුතුව ශ්‍රී ලංකාව සඳහා සකසනු ලබන සංවර්ධන වැඩසටහනේ කොටසක් වශයෙන් සලකමින් සැලකිල්ලට ගතයුතු මහා ප්‍රවණතාවන් ද තිබේ. සියයට 3 ක් වාර්ෂික අනුපාතයකින් යුතුව රට නාගරීකරණය වන බවට ගණන් බලා තිබේ. එබැවින්, ඉහළ යන අභිලාෂයකින් යුක්ත වන්නාවූ වර්ධනය වන නාගරික ජනගහනයේ අපේක්ෂාවන්ට අනුකූල වන පරිද්දෙන් උසස් ජීවන තත්වයක් සහිත නගර නිර්මාණය කරමින් මෙම නාගරීකරණ ක්‍රියාවලිය සමග සමගාමීව ගමන්කිරීමේ කටයුත්තට ප්‍රමුඛතාවයක් ලබාදිය යුතුව තිබේ. මේ සඳහා යටිතල පහසුකම් සහ නිවාස පමණක් නොව විවේක සහ විනෝද කටයුතු සඳහා අවස්ථා ද අවශ්‍ය ය. මේ සම්බන්ධයෙන් සිදුකරන කටයුතුවලදී, දැනට සිදුකෙරෙමින් පවතින ප්‍රධාන නාගරික කලාප සැලසුමේ ඉදිකිරීම් පමණක් නොව රටේ නොයෙක් ප්‍රදේශවල වර්ධන ධ්‍රැව නිර්මාණය කර කලාපීය සමතුලිතතාවයකින් යුතු වර්ධනයක් රට තුල ඇති කිරීම පිණිස 'දෙවන පෙළ නගර' සංවර්ධන වැඩසටහනක් ද ක්‍රියාත්මක කිරීම වැදගත් වේ.

කාලගුණ විපර්යාස සෑම රටක ම පාහේ ප්‍රතිපත්ති සැකසීම විෂයෙහි වැඩි වැඩියෙන් බලපෑම් ඇතිකිරීමට ඉඩ තිබෙන හෙයින් එම සාධකය ප්‍රතිපත්ති සැකසීමෙහි ලා සැලකිල්ලට ගතයුත්තකි. නිතර නිතර ඇතිවන ප්‍රබල කාලගුණ තත්වයන් සැලකිල්ලට ගනිමින් ආපදා කළමනාකරණ පියවරයන් දියත් කළ යුතුව තිබේ. කාබන් ඩයොක්සයිඩ් විමෝචනය අවම කිරීම සම්බන්ධයෙන් චීනය සහ අමෙරිකා එක්සත් ජනපදය විසින් මෑතක දී දෙන ලද පොරොන්දු තුළින් ගම්‍ය වන්නේ දිගු

කාලයක් තිස්සේ කල්යමින් පැවති එක්සත් ජාතීන් ගේ පශ්චාත් ක්යෝටෝ ජාත්‍යන්තර කාලගුණ සමුළුවෙහි දී ඇති කරගන්නා ලද එකඟතාවන් අඩංගු ගිවිසුම දැන් ඇතිවීමට ඉඩ ඇති බවයි. එහෙයින්, එවැනි ගිවිසුමකින් ඇතිවිය හැකි බලපෑම් ද ප්‍රතිපත්ති සැකසීමේ දී අවධානයට ගැනීම අවශ්‍ය ය.

මෙවැනි ජාත්‍යන්තර එකඟතාවයක් තුලින් ඇතිවිය හැකි වැදගත් බලපෑමක් වනුයේ පුනර්ජනණීය බලශක්ති භාවිත කිරීමට ජාත්‍යන්තර වශයෙන් ඇතිවිය හැකි කැපවීමයි. මෙහි ලා, ශ්‍රී ලංකාව ප්‍රමුඛතාවයක් ලබාදිය යුත්තේ සූර්ය බලශක්තිය සහ සුළං බලශක්තිය නිපදවීම කෙරෙහිය. පිරිසිදු බලශක්තියක් වෙත යොමුවන සන්දර්භය තුල ශ්‍රී ලංකාවේ ස්වභාවික ගෑස් නිධි ගවේෂණ සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු කිරීම අවශ්‍ය වේ. ස්වභාවික ගෑස් සොයාගැනීමට හැකි වුවහොත් එතුලින්, ඛනිජ තෙල් ආනයනය කිරිම සඳහා කාලාන්තරයක් තිස්සේ ශ්‍රී ලංකාව විසින් සිදුකරන අධික වැය අඩුකර ගැනීමට ද හැකිවනු ඇත. රජය විසින් මෑතකදී ප්‍රකාශයට පත්කරන ලද 'බලශක්ති උපායමාර්ගය' කඩිනමින් ක්‍රියාත්මක කළයුතු නමුත් ඊට පෙර ඒ සම්බන්ධයෙන් සියළු පංගුකරුවන්ගේ අදහස් විමසීමක් සිදුකිරීම අවශ්‍යතාවකි.

සුවිශාල දත්ත, වලාකුළු තාක්ෂණය (cloud technology), ස්මාර්ට් සංනිවේදන උපකරණ, උසස් රොබෝ විද්‍යාව (දැනුම් මූලික කටයුතු ස්වයංක්‍රීයකරණය ඇතුළුව) වැනි දැවැන්ත තාක්ෂණමය ප්‍රවණතා හේතු කොටගෙන ප්‍රයෝජනවත් අවස්ථාවන් මෙන් ම අවුල් සහගත තත්ත්වයන් ද ලොව පුරා නිර්මාණය වීමට ඉඩ තිබේ. මෙකී ප්‍රවණතාවන් හේතු කොටගෙන මතු විය හැකි ප්‍රයෝජනවත් අවස්ථාවන් මෙන් ම අභියෝගයන් ද දේශීය වශයෙන් සැලකිල්ලට ගෙන කටයුතු කිරීමට ශ්‍රී ලංකාව පියවර ගත යුතු ය.

ලෝක වෙළෙඳ සංවිධානය විසින් සකස් කරන ලද තොරතුරු තාක්ෂණ සම්මුතියට අත්සන් කිරීම නිසා එම ගිවිසුමේ අඩංගු ලැයිස්තුවට අයත් සියළුම නිෂ්පාදන තීරුබදුවලින් නිදහස් කිරීම අවශ්‍ය වනු ඇත. දැනටමත් තොරතුර තාක්ෂණ නිෂ්පාදනවලින් සියයට 77.5 ක් මත තීරු බද්දෙන් නිදහස් අතර ඉතිරි භාණ්ඩවලට අය කෙරෙනුයේ 4%ක තීරු බද්දක් පමණි. තත්වය මෙසේ පවතින හෙයින් ශ්‍රී ලංකාවේ බදු ව්‍යුවහයේ හෝ රජයේ ආදායමේ සැලකිය යුතු වෙනසක් ගිවිසුම නිසා ඇති නොවනු ඇත. සංවර්ධනය වීමේ දැවැන්ත හැකියාවක් පෙන්නුම් කරන මේ අංශයේ ආනයන වලින් වැඩි කොටසක් එම අංශයේ නිෂ්පාදනවල පිරිවැය පහත හෙලීමට සාධක වන ප්‍රාග්ධන භාණ්ඩ වේ. ඒ හැරුණුවිට, තොරතුරු තාක්ෂණ ගිවිසුම අත්සන් කිරීම හරහා තීරුබදු නියත මට්ටමකට ගෙන එනු ඇති අතර දීර්ඝකාලීන සැලසුම් කිරීම සඳහා මෙය හිතකර තත්වයකි. මෙවැනි කරුණු නිසා, ශ්‍රී ලංකාව තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ආයෝජනයට වඩා ආකර්ෂණීය පරිසරයක් සහිත රටක් ලෙස දේශීය මෙන්ම විදේශීය ආයෝජකයන්ගේද අවධානයට ලක් වනු ඇත.

**සමාප්තිය**

වසර 50 කට අධික කාලයකට පසුව බෙහෙවින් හිතකර වාතාවරණයක් ශ්‍රී ලංකාවේ දැන් නිර්මාණය වී තිබේ. වෙළෙඳාම පහත වැටුණු දුෂ්කර වකවානු ද වේගවත් ජනගහණ වර්ධනය ද ඉහළ යැපීම් අනුපාත ද අයෝග්‍ය වැසුණු ආර්ථික ප්‍රතිපත්ති ද ප්‍රධාන වශයෙන් ම සිවිල් ගැටුම ද වැනි හේතු රාශියක් විසින් ඉකුත් දශක පහ තුළ දී මෙරට සංවර්ධනය අඩාල කරවන ලදී. දැනට එවැනි බාධාවන් මෙරට ආර්ථික ඉදිරිම□□හි පෙනෙන්නට නැත. විශේෂයෙන්ම ආර්ථික පරිසරය හිතකර තත්වයක තිබේ . ශ්‍රී ලංකාව පිහිටා ඇති ආසියාව වර්තමාන ලෝකයේ ආර්ථික වශයෙන් වැඩි ශීඝ්‍රතාවයකින් ඉදිරියන යන කලාපයයි. ගෝලීය ආර්ථිකයේ නැගී එමින් සිටින දැවැන්තයන් වන චීනය සමග පවතින සමීප සම්බන්ධතාව ද ඉන්දියාව ආසන්නයේ පිහිටා තිබීම ද ශ්‍රී ලංකාවට වාසිකර සාධකයන් වේ. කෙසේ වුව ද ඉතිහාසයේ ලියැවෙන එවැනි සංයෝජනයක ප්‍රතිලාභ අත් කරගත හැකි වන්නේ සංවර්ධනය ශක්තිමත් කරවන ඵලදායිතාව හා තරගකාරිත්වය ඉහළ මට්ටමකට ගෙන යන ඒකායන වැඩ පිළිවෙළක් තුළින් පමණි.

විකල්ප යෝජනා කීපයක් පළ කිරීම පිණිස ඉදිරිපත් කැරෙන මෙම පත්‍රිකාවෙහි අරමුණ වන්නේ ඉදිරි මග සැලසුම් කිරීමෙහි ලා දායකත්වයක් ලබා දීමයි. එතුල විකල්ප කිහිපයක් යෝජනා කෙරේ. වෙනස් කිරීම් සඳහා ගැනෙන පියවරයන් හි වේගය හා අනුපිළිවෙළ තීරණය කිරීම පවතින රජයේ වගකීමකි. අවසාන අරමුණ විය යුත්තේ විශේෂයෙන් ම තරුණ පිරිස් ඇතුළු ශ්‍රී ලාංකිකයන් අයිතිවාසිකම් බලාපොරොත්තු වන සංස්කෘතියක් වෙතින් මුදවාගෙන ස්වකීය හැකියාවන් මුදා හැරීමේ සංස්කෘතියක් වෙත අවතීර්ණ කරවීමයි. මානව සම්පත් සංවර්ධනය සඳහා පවතින

අවස්ථාවන් වැඩි කිරීම ද ඉහළ වටිනාකමකින් යුතු ඵලදායී රැකියා අවස්ථාවන් සැලසීම ද තුළින් මෙම අරමුණ සපුරාගත හැකි වනු ඇත.